සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4thfloor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/16/BSM/පරිගණක

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2016/11/30

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ,
සියලුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්,
සියලුම බැංකු අධීක්ෂණ කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරින්

**<u>දිවිනැගුම ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීම සඳහා පරිශීලක අංකය (User ID) සහ මුරපදය ( Pass Word ) නිකුත් කිරීම සඳහා අයදුම්පත්‍රය</u>**

දිවිනැගුම ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීම සඳහා පරිශීලක අංකය (User ID) සහ මුරපදය ( Pass Word ) අදාල බැංකු කළමනාකරුවන් හා බැංකුවේ අනිකුත් නිලධාරින්ට දිය යුතුව ඇත. ඒ සඳහා මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය බැංකුවේ කළමනාකරු විසින් සම්පූර්ණ කර කළමනාකරුගේ ප්‍රකාශය / සහතිකය, මූලස්ථාන කළමනාකරු, ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු හා ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය සමඟ දිස්ත්‍රික් අධීක්ෂණ කළමනාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

02. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත මෙම සහතිකය ලැබීමෙන් අනතුරුව දිස්ත්‍රික් අධීක්ෂණ කළමනාකරුවන් විසින් එම අයදුම්පත්‍රයේ සඳහන්ව ඇති මූලික තොරතුරු අදාල ලේඛන සමග පරීක්ෂා කර බලා එහි නිරවද්‍යතාවය තහවුරු කර, ක්ෂුද්‍රමූල්‍ය අංශයේ පරිගණක විෂයභාර කළමනාකරු වෙත ඉදිරිපත් කල යුතුය.

03. විෂයභාර කළමනාකරුගේ නිර්දේශය පදනම් කර ගනිමින්, අධ්‍යක්ෂ ක්ෂුද්‍රමූල්‍යගේ අනුමැතිය මත, තොරතුරු තාක්ෂණ අංශයේ පද්ධති විශ්ලේෂක විසින් පරිශීලක අංකය (User ID) සහ මුරපදය ( Pass Word ) බැංකුවේ අදාල නිලධාරියා වෙත ලබාදෙනු ලැබේ. පරිශීලක අංකය හා මුරපදය ලබාදුන් පසු මුරපදය ( Pass Word ) තමාගේ අභිමතය පරිදි වහාම වෙනස්කර ගැනීම සහ එහි වගකීම අදාල නිලධාරියා සතුය.

04. එම අංකයේ රහස්‍යභාවය රැක ගැනීමට කටයුතු කිරීම අදාල නිලධාරියාගේ වගකීම වේ. **එය අන්සතු කර පරිගණක පද්ධතිය තුළ යම් ගැටලුවක් හෝ අයතා පරිහරණයක් සිදුවුවහොත්,** මුරපදය ( Pass Word ) අයිති නිලධාරින්ට **විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.** එබැවින්, මෙම පරිශීලක අංකයේ (User ID) සහ මුරපදයේ (Pass Word) රහස්‍යභාවය අදාල නිලධාරින් විසින් අනිවාර්යෙන්ම ආරක්ෂා කල යුතු බව තවදුරටත් සඳහන් කරමි.

05. දැනට දිස්ත්‍රික් අධීක්ෂණ කළමනාකරුගේ නිර්දේශයෙන් මුරපදය ලබා දුන් සෑම බැංකුවක්ම මෙම අයදුම්පත්‍රය පිටපත් දෙකකින් සම්පූර්ණ කර පුරවා අධීක්ෂණ කළමනාකරු විසින් පරිගණක විෂය භාර කළමනාකරු හෝ අධීක්ෂණ හා මෙහෙයුම් අංශ භාර කළමනාකරු වෙත ලබා දිය යුතු වේ.

06. ඉදිරියේදී මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කර එවූ පසුව පමණක්, පරිශීලක අංකය (User ID) සහ මුරපදය (Pass Word ) නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

නීල් හපුහින්න,
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:-

01. පද්ධති විශ්ලේෂක, තොරතුරු තාක්ෂණ අංශය